005

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය
අධ්‍යාපන පීඨය
අධ්‍යාපනවේදී නාට්‍ය හා රංගකලා ගෞරව උපාධි වැඩසටහන-පස්වන මට්ටම - 2021/2022
අවසාන පරීක්ෂණය 2022
STU5317/STU5330 - ළමා අයිතිවාසිකම්
කාලය පැය තුනයි. (03)

---

දිනය - 2022.11.25 වේලාව - ප.ව.01.30 - ප.ව.04.30 දක්වා

---

1 වන කොටසේ සියළුම ප්‍රශ්නවලට ද, 2 වන කොටසේ ඕනෑම ප්‍රශ්න තුනකට (03) ද පිළිතුරු සපයන්න.

1 වන කොටස

01. "ළමා අයිතිවාසිකම්" යන්න නිර්වචනය කරන්න.

02. ළමා අයිතීන් පාලනය කෙරෙන ප්‍රධාන මූලධර්ම තුන (03) නම් කරන්න.

03. ළමයින් සතු සහභාගිත්වය සඳහා ඇති අයිතිය යනුවෙන් අදහස් කරන්නේ කුමක් ද?

04. ක්‍රීඩාව හා විවේකය සම්බන්ධ අයිතිවාසිකම් අහිමි වූ ළමුන් කාණ්ඩ තුනක් (03) සඳහන් කරන්න.

05. 'අපත්‍යීකරණය' යනුවෙන් අදහස් වන්නේ කුමක් ද?

06. ළමා අයිතිවාසිකම් පිළිබඳ වඩා දැනුවත් කළයුතු ජන කාණ්ඩ පහක් (05) නම් කරන්න.

07. ළමා හා මාතෘ රැකවරණය සඳහා ශ්‍රී ලංකාවේ රජයන් ගෙන ඇති ක්‍රියාමාර්ග පහක් (05) ලියන්න.

08. නාට්‍ය හා රංගකලා ගුරුවරයෙකු වශයෙන් ළමා අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සඳහා ඔබට දැරිය හැකි වගකීම් පහක් (05) සඳහන් කරන්න.

(ලකුණු 05 x 08 = 40)

## 2 වන කොටස

09. (i) ළමා වර්ධනය හා සංවර්ධනය යන සංකල්ප කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 05)

(ii) ළමයාට ජීවත්වීමට ඇති අයිතිය කෙරෙහි බලපාන මවගේ හා ළමයාගේ සෞඛ්‍ය හා පෝෂණ සාධක දෙකක් (02) නම් කර ඉන් එක් සාධකයක් කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 05 )

(iii) ශ්‍රී ලංකාවේ පවතින වත්මන් තත්ත්වය තුළ මවගේ සහ දරුවාගේ සෞඛ්‍යය හා පෝෂණ තත්ත්වය සම්බන්ධයෙන්, ළමයාට ජීවත්වීමට ඇති අයිතිය කෙරෙහි බලපාන ගැටලු දෙකක් (02) උදාහරණ ඇසුරින් සාකච්ඡා කරන්න. ප්‍රජාවක් ලෙස එම ගැටලු මගහරවා ගැනීමට යෝජනා දෙකක් (02) ඉදිරිපත් කරන්න. (ලකුණු 10)

10. (i) පුරාතන යුගයේ ශ්‍රී ලංකාවේ ළමා අයිතිවාසිකම් පිළිබඳ පැවති තත්ත්වය කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 05)

(ii) ශ්‍රී ලංකාවේ ළමා අයිතිවාසිකම් පිළිබඳ පැවති තත්ත්වය වැඩි දියුණු කිරීම සඳහා ලන්දේසි යුගයේ දී ගන්නා ලද පියවර හතරක් (04) දක්වන්න. (ලකුණු 05)

(iii) නිදහසින් පසු ශ්‍රී ලංකාවේ ළමා අයිතිවාසිකම්වල පැවැති තත්ත්වය වැඩි දියුණු කිරීම සඳහා රජය විසින් ගන්නා ලද පියවර පැහැදිලි කරන්න. (ලකුණු 05)

11. (i) ළමා අයිතිවාසිකම් පිළිබඳ එක්සත් ජාතීන්ගේ සම්මුතියෙහි දක්වා ඇති අයිතිවාසිකම් කාණ්ඩ හතර (04) නම් කරන්න. (ලකුණු 04)

(ii) ළමයාගේ උපරිම යහපත සලකා අධිකරණය විසින් තීරණ ගතයුතු කාරණා තුනක් (03) නම් කරන්න. (ලකුණු 06)

(iii) ඉහත නම් කල එක් එක් කරුණක් සම්බන්ධයෙන් ළමයාගේ උපරිම යහපත සලකා අධිකරණය විසින් තීරණ ගනු ලබන ආකාරය නිදසුන් සහිතව සාකච්ඡා කරන්න. (ලකුණු 10)

12. (i) "ළමා අපයෝජනය" යනු කුමක් ද? (ලකුණු 04)

(ii) ශ්‍රී ලංකාවේ ළමා අපයෝජනය සිදුවන ප්‍රධාන ස්වරූප හතරක් නම් කර ඉන් එකක් කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 08)

(iii) ශ්‍රී ලංකාව තුළ ළමා අපයෝජනය වැලැක්වීමට හා පාලනය කිරීම සඳහා ගෙන ඇති පියවර හතරක් (04) උදාහරණ දක්වමින් විස්තර කරන්න. (ලකුණු 08)

13. (i) ශ්‍රී ලාංකික ප්‍රජාව, ළමා අයිතිවාසිකම් පිළිබඳ දැනුවත් කිරීමට සුදුසු සන්නිවේදන උපායමාර්ග තුනක් (03) දක්වන්න. (ලකුණු 03)

(ii) ළමා අයිතිවාසිකම් පිළිබඳ ප්‍රජාව දැනුවත් කල යුත්තේ ඇයි? උදාහරණ දෙකක් (02) ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 07)

(iii) ළමා අයිතිවාසිකම් පිළිබඳ ප්‍රජාව දැනුවත් කිරීමේ දී මාධ්‍යවේදීන් මුහුණ දෙන ගැටළු දෙකක් (02) උදාහරණ ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 10)

14. (i) පවුලක් නොමැති දරුවෙකුගේ ආරක්ෂාව හා භාරකාරත්වය සම්බන්ධයෙන් ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වන නීති කෙටියෙන් සඳහන් කරන්න. (ලකුණු 04)

(ii) ශ්‍රී ලංකාවේ අවතැන් වූ දරුවන්ගේ අයිතිවාසිකම් පිළිබඳ කෙටි විග්‍රහයක යෙදෙන්න. (ලකුණු 08)

(iii) ඉහත (ii) හි සඳහන් දරුවන්ගේ අයිතිවාසිකම් සුරක්ෂිත කිරීම සඳහා ගතයුතු පියවර යෝජනා කරන්න. (ලකුණු 08)

හිමිකම් ඇවිරිණි.